**මහියංගණය ප්‍රාදේශීය සභාව - 2021**

**--------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මහියංගණය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහියංගණය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.)අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය(මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් වලට එළඹුනු රු.5,679,867 ක සංවර්ධන ව්‍යාපෘති 03 ක් 2021 දෙසැම්බර් 31 දින වනවිටත් ඉටු නොකර අතහැර දමා තිබූ නමුදු, එම වටිනාකම කර්මාන්ත ණයහිමි හා කර්මාන්ත ණය ගැති වශයෙන් දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් හා ජංගම වගකීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු, කුලී, සේවා සඳහා ගාස්තු සහ වෙනත් ආදායම් ආදියෙහි බිල්කළ ආදායම රු. 70,817,931 ක් වුවද, මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 88,571,687 ක් ලෙසට රු. 17,753,756 ක් වැඩියෙන් දක්වා තිබීම මත අතිරික්තය හා ලැබිය යුතු දෑ වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදි නිවැරදි කරන බව සඳහන් කර ඇත. | |
| (ඇ) | වසර 12 සිට 21 දක්වා වූ දීර්ඝ කාලයක් තුළ අයකර ගත නොහැකිව තිබුණු නමුදු, ලැබිය යුතු දෑ(Recievables) වල ඇතුළත් කර තිබුණු, එකතුව රු.495,683 ක් වූ හිඟහිටි වෙනත් ආදායම් ගිණුම් ශේෂ 09 ක් අයකර ගත නොහැකිවීමේ හේතුව මත නිසි අනුමැතිය ලබාගෙන එකී ගිණුම් ශේෂ සමුච්චිත අරමුදලට කපා හැරීම වෙනුවට | හිඟ ආදායම් කපා හැරිම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

ජංගම වත්කම් ලෙස තවදුරටත් දක්වා තිබීමෙන් එම වටිනාකමින් ව්‍යාජ වත්කමක් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 37,554,458 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,945,374 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහියංගණය නගරයේ පිහිටි සභාවට අයත් ඉඩමක බදුකරුවන් විසින් මුදල් වැයකර ඉදිකර තිබුණු කඩ කාමර 31 කින් සමන්විත වෙළඳ සංකීර්ණය 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම වසර 09 ක කාලයක් විවිධ පාර්ශවයන් වෙළඳාම් කටයුතු සිදු කරමින් සිටින අතර, සභාව බදුකරුවන් සමඟ ගිවිසුම් වලට එළඹ බදු කුලී අයකරගෙන නොතිබුණි. | ගිවිසුම් වලට එළඹීමට කටයුතු කරමින් සිටින බව සඳහන් කර ඇත. | බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ හිඟ බදු ආදායම් අයකර ගත යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන වරිපනම් බදු ඒකක 114 කින් සහ පෞද්ගලික හා වෙනත් වරිපනම් බදු ඒකක 1966 කින් අයකර නොගත් හිඟ වරිපනම් බදු රු.3,227,877 ක් සම්බන්ධයෙන් රතු නිවේදන නිකුත් කර තිබුණද, අය කරගෙන නොතිබුණි. | හිඟ අය කර ගැනීම සඳහා කටයුතු කිරීම මාස 06 කින් ප්‍රමාද කිරීමට සභා අනුමැතිය ලැබී තිබුණු බව සඳහන් කර ඇත. | හිඟ ආදායම් අය කරගත යුතුය. |
| (ඇ) | 2000 වසරේ සිට පැවත එන සභාව විසින් වාර්ෂිකව බදු දී තිබුණු දේපළ වලට අදාළ පොළ කුලී, මස් කඩ,මාළු කඩ සහ පොදු වැසිකිළි හිඟ බදු රු.1,919,224 ක් අය කරගෙන නොතිබුණි. | අය කර ගැනීම සඳහා ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව සඳහන් කර ඇත. | |

3. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව බල ප්‍රදේශයේ එක්රැස්වන ටොන් 800 ක පමණ කසළ මහියංගණ බදුල්ල ප්‍රධාන මාර්ගයේ මහවැලි ගඟ ආසන්න ස්ථානයකට අක්‍රමවත් ලෙස බැහැර කරන අතර, සමාලෝචිත වර්ෂයේදී කසළ බැහැර කිරීමේ කටයුතු සඳහා රු.4,439,063 ක පමණ වියදමක්ද දරා තිබුණි. මේ සඳහා සභාව විසින් සේවකයින් 25 දෙනෙකු, ට්‍රැක්ටර් රථ 05ක් සහ එක් ලොරි රථයක්ද සේවයේ යොදවා තිබුණි.මහියංගණය දෙහිගොල්ල ග්‍රාමයේ අක්කර 5 ක පමණ භූමියක් වෙන් කරගෙන රු.16,203,454 ක වියදමක් දරා ස්ථිර කසළ අංගනයක්, කාර්යාල ගොඩනැඟිල්ලක් සහ ගොඩනැඟිලි වලට අවශ්‍ය විදුලි සම්බන්ධතාවය ලබාගෙන තිබුණද, ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය නිසා අංගනය භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පවතින අතර, වසර 06 ක පමණ කාලයක් කසළ ප්‍රතිචක්‍රීයකරණය කර නොතිබුණි. දීර්ඝ කාලයක් තිස්සේ ඉවතලන ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා මහවැලි ගඟ ආසන්නයේ වලක් කපා බැහැර කිරීම හේතුවෙන් ජල මූලාශ්‍රය අපවිත්‍ර වන අතර, කසළ බැහැර කිරීමේ විධිමත් සැලැස්මක් නොතිබුණි. | වෙන් කරනලද කසළ අංගනයේ කසළ බැහැර කිරීමට ප්‍රදේශවාසීන්ගේ දැඩි විරෝධතාවය පවතින බව සඳහන් කොට ඇත. | කසළ නිසි ලෙස බැහැර කළ යුතුය. |